European Union

**ඒකාබද්ධ ප්‍රකාශය**

*ජර්මනි, ඉතාලි, නෙදර්ලන්ත තානාපති කාර්යාල සහ එක්සත් රාජධානියේ මහා කොමසාරිස් කාර්යාලය මෙන්ම නෝර්වේ සහ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලවල එකඟතාව මත යුරෝපා සංගමයේ නියෝජිත මණ්ඩලය විසින් පහත ප්‍රකාශය නිකුත් කෙරේ.*

බරපතළ මානව හිමිකම් සහ මානවවාදී නීති උල්ලංඝනය කිරීමේ චෝදනාවලට ලක් වී සිටින ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා ශ්‍රී ලංකා යුද හමුදාවේ යුදහමුදාපති තනතුරට පත් කිරීම සම්බන්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් මිචෙල් බැචෙලේ මහත්මිය යොමු කර ඇති දැඩි අවධානය කෙරෙහි අපගේ ද පූර්ණ සහයෝගය හිමිවේ.

ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා යුද හමුදාපති ධූරයට උසස් කිරීම මගින්, සාධාරණත්වය සහ වගවීම තහවුරු කිරීම සඳහා 2019 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සියලට දැක්වූ සහයෝගය පිළිබඳ ගැටළු මතු වී තිබේ. එමෙන්ම එමගින් ජාතික සංහිඳියාව කෙරෙහි ශ්‍රී ලංකාව දක්වන කැපවීම පසුබෑමකට ලක්කරන අතර යුද්ධයේ ගොදුරු බවට පත් වූ සහ යුද්ධයෙන් දිවි බේරා ගත් ජනතාවට පීඩාකාරී පණිවිඩයක් ද යොමු කෙරේ.

2019 අගෝස්තු 20, කොළඹ

අවසන්

සම්බන්ධ වන්න:
දේශපාලන, වෙළඳ සහ සන්නිවේදන අංශය
යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින් නියෝජිත මණ්ඩලය
දු:ක: + 94 11 2674413-4